# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2380/13 – 2024 අප්‍රේල් මස 17 වැනි බදදා – 2024.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2022/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. ආර්. කේ. අබේකෝන් මිය, හැළඹගහමුල වත්ත, සමගි මාවත, වදුරාගල, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා බැංකුව, 16 වන මහල ''ලංකා බැංකු චතුරස්‍රය'', අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී


1A – G 41769 - 09(2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නක්කාවත්ත, බිහල්පොල, මුතුගල පාර, නීතිඥ රණසිංහ ආරච්චිලාගේ තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය

මගේ අංකය: IR/COM/02/2022/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. ආර්. කේ. අබේකෝන් මිය, හැළඹගහමුල වත්ත, සමගි මාවත, වඳුරාගල, කුරුණෑගල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා බැංකුව, 16 වන මහල ''ලංකා බැංකු චතුරස්‍රය'', අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ලංකා බැංකුවේ සේවය කළ ඒ. එම්. ආර්. කේ. අබේකෝන් මිය විශ්‍රාම යාමේ දී ලංකා බැංකුව විසින් ගෙවන ලද විශ්‍රාම වැටුප හා පරිවර්තිත විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී අසාධාරණයක් සිදුවී තිබේද යන්නත් අසාධාරණයක් සිදුවී තිබේ නම් ලැබිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ".

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (*වැ. බ*).

2024 මාර්තු මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.